4. සියලුම අයදුම්කරුවන් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙත පමණක් තම අයදුම්පත් ඉදිරිපත් කළයුතු අතර අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් පිළිබඳව සලකා බලනු නොලැබේ.

5. පහත සඳහන් ලකුණු දීමේ පටිපාටිය අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට අයදුම්කරුවන් ඉදිරිපත් විය යුතු අතර එහි දී වැඩිම ලකුණු ලබාගන්නා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව සම්පූර්ණ කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

කේ. ඒ. තිලකරත්න,
ලේකම්,
යෞවන කටයුතු හා නිපුණතා
සංවර්ධන අමාත්‍යාංශය.

අංක 354/2,
නිපුණතා පියස,
ඇල්විටිගල මාවත,
කොළඹ 5.

ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ I පන්තියට උසස් කිරීමේ සම්මුඛ පරීක්ෂණයේ ලකුණු දීමේ පරිපාටිය

පරීක්ෂණය සඳහා මුළු ලකුණු 100

1. ජ්‍යෙෂ්ඨත්වය සඳහා - ලකුණු 40

1.1 පශ්චාත් උපාධියක් හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ සමාන සුදුසුකම් සහිතව ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ II පන්තියේ වසර 01 ක සේවා පළපුරුද්දෙන් පසුව එළඹෙන එක් වසරක් සඳහා 04 බැගින්,

(උපරිම ලකුණු 40)

හෝ

1.2 ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ II පන්තියේ වසර 05ක සේවා පළපුරුද්දෙන් පසුව එළඹෙන එක් වසරක් සඳහා 04 බැගින්,

(උපරිම ලකුණු 40)

(සේවා කාලය අයදුම්පත් භාරගන්නා අවසාන දින දක්වා සලකා බලනු ලැබේ.)

2. කුසලතාවය සඳහා - ලකුණු 60

2.1 ලබාගෙන ඇති වෘත්තීය සුදුසුකම් සඳහා, (උපරිම ලකුණු 20)

(ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ සේවා ව්‍යවස්ථාවේ 12.1 යටතේ 1 පන්තියට උසස්වීම සඳහා සුදුසුකම් ලබන නිලධාරීන් සම්පූර්ණ කළ යුතු මූලික සුදුසුකම් වන පශ්චාත් උපාධිය හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවට අමතරව සම්පූර්ණ කර ඇති උපාධිය සඳහා පමණක් ලකුණු ලබාදිය යුතු ය.)

| | |
|---|---|
| ආචාර්ය උපාධි PhD | -20 |
| පශ්චාත් උපාධි (M.Sc, MBA, MEng, MPhil, MA, MSsc. . .) | -15 |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා (වසර 01ට නොඅඩු) | -10 |

(කාර්යක්ෂමතා කඩඉම් සඳහා ලබාගෙන ඇති පශ්චාත් උපාධි හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ.)

2.1.1 ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ සේවා ව්‍යවස්ථාවේ 12.2 යටතේ I පන්තියට උසස්වීම සඳහා සුදුසුකම් ලබන අයදුම්කරුවන් සඳහා,

| | |
|---|---|
| ආචාර්ය උපාධි PhD | -20 |
| පශ්චාත් උපාධි (M.Sc, MBA, MEng, MPhil, MA, MSsc. . .) | -15 |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා (වසර 01ට නොඅඩු) | -10 |

2.2 II පන්තියේ උපලේඛනගත තනතුරක (ස්ථිර) ලබා ඇති පරිපාලන පළපුරුද්ද සඳහා අවුරුද්දකට ලකුණු 03 බැගින්,

(උපරිම ලකුණු 15)

2.3 සිදුකර ඇති පර්යේෂණ හෝ එළිදක්වා ඇති නව නිපැයුම් සඳහා එකකට ලකුණු 05 බැගින් (පර්යේෂණ නිබන්ධන හෝ පේටන්ට් බලපත්‍ර ඉදිරිපත් කළ යුතු ය.)

(උපරිම ලකුණු 10)

2.4 ලබා ඇති ප්‍රශංසා සඳහා ලකුණු 02 බැගින්, (උපරිම ලකුණු 10)

2.5 සන්නිවේදන හැකියාව - ලකුණු 02
නායකත්වය - ලකුණු 02
පෞරුෂය - ලකුණු 01 (උපරිම ලකුණු 05)

ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ I පන්තියට උසස් කිරීම සඳහා අයදුම්පත්‍රය

1. නම (මුලකුරු සමඟ) :————.

2. සම්පූර්ණ නම :————.

3. කාර්යාලයීය ලිපිනය :————.

4. පෞද්ගලික ලිපිනය :————.

5. දුරකථන අංකය :————.

6. උපන්දිනය :————.

7. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස :————.

8. ස්ත්‍රී/පුරුෂභාවය :————.

9. විවාහක/අවිවාහක බව :————.

10. ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ II පන්තියට පත්වූ දිනය :————.

11. ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ මුල් පත්වීමේ දිනය :————.

12. 12.1 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට මුළු සේවා කාලය :————.

12.2 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට II පන්තියේ සේවා කාලය :————.

